## බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව

## කළුතර දිස්ත්‍රික්කය

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 සැප්තැම්බර් 25 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 සැප්තැම්බර් 29 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ කඩ කුලී ආදායම රු.9,815 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) 2015 විගණන වාර්තාවේ 2.2.1(උ) නිවැරදි කිරීමේදී සමුච්චිත අරමුදල රු.902,934 ක් අඩුවෙන් හා හිඟ හිටි කර්මාන්ත ආධාර රු.902,934 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ලබාදී තිබූ රු.27,227 ක් වූ දුන් වට්ටම් වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් ගත කළ යුතු වුවත් සමුච්චිත අරමුදල් ගිණුමට හර කිරීම හේතුවෙන් වර්ෂයේ වියදම රු.27,227 ක් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාල ස්ථාවර තැන්පත් වටිනාකම රු.17,656,100 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල රු.17,275,865 ක් ලෙස දක්වා තිබීමෙන් ස්ථාවර තැන්පත් ශේෂය රු.380,235 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයට අදාල ස්ථාවර තැන්පත් පොලිය රු.1,499,150 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවලට රු.897,317 ක් ලෙස දක්වා තිබීමෙන් ස්ථිර තැන්පත් පොලිය රු.551,834 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ කර්මාන්ත ආධාර ණයගැති රු.487,346 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයට අදාල කර්මාන්ත ණයහිමි වටිනාකම රු.39,502,576 ක් විය යුතු වුවත් මූල්‍ය ප්‍රකාශනවල රු.39,616,786 ක් ලෙස දැක්වීම හේතුවෙන් කර්මාන්ත ණයහිමි වටිනාකම හා කර්මාන්ත වියදම රු.114,210 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේ මාර්ග පළුදු කිරීම වෙනුවෙන් ලබා ගත් රු.2,431,158 ක් වූ තැන්පත් මුදල් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගෙන තිබීමෙන් වර්ෂයේ ආදායම රු.2,431,158 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයට අදාල රු.170,982 ක් වූ වියදම් වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන නොසැළසීම නිසා සමාලෝචිත වර්ෂයේ වියදම හා ණයහිමි වටිනාකම් රු.170,982 කින් මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබුණි.

1.3.2 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.25,520,375 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. <u>මූල්‍ය සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදයමට වඩා වැඩි වූ වියදම රු.8,823,523 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදයමට වඩා වැඩි වූ වියදම රු. 25,439,399 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.16,615,876 ක වර්ධනයක් දක්නට ලැබුණි.

මූල්‍ය ප්‍රතිඵලයේ රු.16,615,876 ක වර්ධනය කෙරෙහි ආදායම් රු.14,267,567 කින් වැඩිවීම හා වියදම් රු.2,348,309 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිලිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| ----------------- | -------------------- | ------ | --------------------- |
| | රු. 000' | රු.000' | රු.000' |
| (i) වරිපනම් හා බදු | 7,698 | 6,339 | 1,981 |
| (ii) බදු කුලී | 722 | 644 | 117 |
| (iii) බලපත්‍ර ගාස්තු | 264 | 264 | -- |

### 2.2.2 වරිපනම් බදු

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භයට රු.2,724,222 ක හිඟයක් පැවති අතර වර්ෂය තුළදී හිඟයෙන් රු.2,101,948 ක් හෙවත් සියයට 77 ක් අයකරගෙන තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට වරිපනම් බිල් කළ ආදායම රු.3,641,796 ක් වූ අතර වර්ෂය තුළදී ඉන් රු.2,283,194 ක් හෙවත් සියයට 63 ක් අයකරගෙන තිබුණි.

(ඇ) අදිකාරිපත්තු උප කාර්යාලයේ වරිපනම් ලේඛන 2014 වර්ෂයෙන් පසු තුලනය කර එක් එක් වරිපනම් ඒකකවලින් අය විය යුතු වරිපනම් බදු ශේෂයන් කොපමණද යන්න ගණනය කර නොතිබුණි.

### **2.2.3** කඩ කාමර කුලී

(අ) 2014 වර්ෂයේදී රු.7,249,950 ක වියදමක් දරා ඉදි කර තිබූ බස් නැවතුම්පල ඉදිරිපිට ඇති වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 08 ක් 2017 මැයි 15 දක්වාම බදුදීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2015 ඔක්තෝබර් 25 දින ඇති කර ගත් සභා තීරණයට අනුව කඩ කාමර බදු දීමට කටයුතු නොකිරීම හේතුවෙන් අක් මුදල් ලෙස රු.9,913,000 ක ආදායමක් හා 2015

ඔක්තෝබර් 25 සිට 2016 දෙසැම්බර් දක්වා මාසික කුලිය ලෙස රු.457,800 ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි.

**2.2.4** කර්මාන්ත බදු

සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ කර්මාන්ත බදු ශේෂය වූ රු.44,500 න් අයකිරීමට නොහැකි වී තිබූ රු.27,000 කට අදාලව නඩු පවරා තිබූ අතර නඩු පවරන ලද මුදලින් රු.18,000 ක් තවදුරටත් හිඟව පැවතුණි.

**2.2.5** ව්‍යාපාර බදු

සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ ව්‍යාපාර බදු ශේෂය වූ රු.231,000 න් වර්ෂය තුළ අයකිරීමට නොහැකි වූ රු.151,000 ක මුදල සඳහා නඩු පවරා තිබූ අතර නඩු පවරන ලද මුදලින් රු.104,400 ක් තවදුරටත් අයවීමට තිබුණි.

2.2.6 කඩ කුලී ආදායම්

බණ්ඩාරගම නව වෙළඳ සංකීර්ණය තුළ බදු දී තිබූ කඩ කාමර 15 සඳහා ගිවිසුමෙහි 12 ඡේදය ප්‍රකාරව කඩකාමරවලට අදාල ජල බිල්පත් ගෙවීම බදුකරු විසින් දැරිය යුතු වුවත් සභාව යටතේ ඇති කිරිහල සඳහා වූ ජල ටැංකියෙන් කඩකාමර සඳහා සැපයූ ජලය වෙනුවෙන් ගාස්තු අයකර නොතිබුණි.

2.2.7 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 8,010,907 |
| (ii) | මුද්දර ගාස්තු | 59,383,936 |

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

(අ) (i) 2016 දෙසැම්බර් 31 දිනට සභාවේ තනතුරු 23 ක් සඳහා අනුමත කාර්ය මණ්ඩලය 192 ක් වුවද, තථ්‍ය කාර්ය මණ්ඩලය 200 ක් විය.

(i) අනුමත තනතුරු 05 ක පුරප්පාඩු 11 ක් පවතින අතර තනතුරු 03 ක 21 දෙනෙකුගේ අතිරික්තයක් තිබුණි.

(ii) ස්ථිර කාර්ය මණ්ඩලයට අයත් නොවූ ආදේශක පදනම මත 06 ක් හා කොන්ත්‍රාත් පදනම මත එක් අයෙකු බඳවාගෙන තිබුණි.

(ආ) විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට 2016 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු.858,773 ක හිඟ විශ්‍රාම වැටුප් දායකය 2017 මැයි 25 දින වන විටත් ප්‍රේෂණය කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ හා පෙර වර්ෂයේ මාර්ග පළුදු කිරීම වෙනුවෙන් ලබාගෙන තිබූ රු.4,380,701 ක් වූ තැන්පත් මුදලින් මාර්ග නැවත යථා තත්ත්වයට පත් කිරීමට නොයෙදා ආදායමක් වශයෙන් ගිණුම් ගත කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ හා පෙර වර්ෂයන්හි අනුකූලතා සහතික ලබා නොගත් ගොඩනැගිලි 512 ක් සඳහා අනුකූලතා සහතික ලබා දී නව තක්සේරුවක් සිදු කර වරිපනම් ආදායම අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී සති පොල ව්‍යාපාරිකයින් 16 දෙනෙකුගෙන් රු.48,000 ක මූලික තැන්පතු මුදල හා ව්‍යාපාරිකයින් 148 දෙනෙකුගෙන් රු.689,090 ක මාසික ගාස්තුව හිඟව පැවතුණි.

3.2 **නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත භෞතික සම්පත්**

යන්ත්‍රානුසාරයෙන් කළුගල් ඇඹරීම සඳහා රු.2,472,740 ක් වැය කර 2008 වර්ෂයේදී මිලදී ගෙන තිබූ කළුගල් කැඩීමේ යන්ත්‍රය 2009 වර්ෂයේ සිට නිශ්ක්‍රීයව පැවතුණි.

3.3 **වැඩ නිම නොවූ ව්‍යාපෘති**

2014 වර්ෂයේ පළාත් නැගුම ව්‍යාපෘතිය යටතේ රු.10,000,000 ක ඇස්තමේන්තුවක් මත ඉදිකිරීම් ආරම්භ කර තිබූ ගල්පාත ආදාහනාගාරය, 2017 මැයි වන විටත් වැඩ නිම කර නොතිබුණි.

3.4 **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

සභාව විසින් කසළ කළමනාකරණ කටයුතු වෙනුවෙන්, දෙල්දොරවත්තෙහි කොම්පෝස්ට් අංගනයක් පවත්වා ගෙන ගොස් තිබූ නමුත් බැහැර කරන ස්ථානය සඳහා පරිසර බලපත්‍රයක් ලබාගෙන නොතිබුණු අතර කසළ කළමනාකරණය සඳහා වැය වන පිරිවැය ආවරණය කිරීම සඳහා කසළ බදු පනවා නොතිබුණි.

4. **පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පාලනය

(ඇ) සේවක මණ්ඩල කළමනාකරණය

(ඈ) වාහන පාලනය

(ඉ) අයවැය පාලනය